**05-09-2020 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම අසීමිත නාටකයේ, ඔය ජීවයන්ට තමන්ගේම චරිත කොටස් ලැබී ඇත. ඔබ දැන් ඔබගේ ශරීරය නම් වූ ඇඳුම ගලවා දමා ආපසු නිවහනට යා යුතුයි. ඉන්පසු ඔබගේ නව රාජධානියට ඔබ යා යුතුයි.

**ප්‍රශ්නය:** පියා, මෙලොවට පැමිණෙනවා මිස, සිතිවිලි මාර්ගයෙන් කිසිම කටයුත්තක් සිදු නොකරන බව ඔප්පු කරන්නේ කෙසේද?

**පිළිතුර:** පියා ගැන පවසන්නේ ඔහු කරන්කරවන්හාර් කියාය. සිතිවිලි මාර්ගයෙන් දිරිගන්වනවා කියන්නේ සිතනවාටයි. අළුත් ලොවක් සිතිවිලි මාර්ගයෙන් ස්ථාපනය කළ නොහැක. පියා නව ලොව ස්ථාපනය කරන්නේ දරුවන්ගේ මාර්ගයෙන්ය. භෞතික ඉන්ද්‍රියන් නොමැතිව ඔහුට කිසි දෙයක් කිරීමට පෙළඹවිය නොහැක. මේ නිසයි ඔහු ශරීරයක ආධාරය ගන්නේ.

ඕම් ශාන්ති. ඔය ආධ්‍යාත්මික දරුවන් ආධ්‍යාත්මික පියා ඉදිරියේ අසුන්ගෙන සිටියි. ඇත්ත වශයෙන්ම ඔය ජීවයන් ඔබගේ පියා ඉදිරියේ අසුන්ගෙන සිටියි. ජීවයක් අනිවාර්යෙන්ම අසුන් ගන්නේ ශරීරයක් සමඟයි. පියා ශරීරයක් ගත් විටයි, ඔබ ඉදිරියෙන් සිටින්නේ. මේ නිසයි ජීවයන් සහ උත්තරීතර ජීවය බොහෝ කාලයක් වෙන් වී සිටියේය යැයි කියැවෙන්නේ. ඊෂ්වර්, ප්‍රභූ සහ උත්තරීතර ජීවය යනුවෙන් දී ඇති විවිධ වූ නම්, අයත් වන්නේ උසස්ම-උසස් පියාට බව ඔය දරුවන්ට වැටහෙයි. කිසිම භෞතික පියෙකුට, උත්තරීතර පියා යැයි කිසි විටෙකත් අමතන්නේ නැත. නිකම්ම උත්තරීතර පියා යැයි ඔබ ලියුවත් කමක් නැත. උත්තරීතර පියා යන්නෙහි අදහස, සෑම කෙනෙකුගේම පියා එක් අයෙක් පමණක් බවයි. අපි උත්තරීතර පියා සමඟ අසුන්ගෙන සිටින බව ඔය දරුවන් දනී. උත්තරීතර පියා, උත්තරීතර ජීවය සහ ජීවයන් වන අප, සාම දේශයේ වැසියන් බව ඔය දරුවන් දනී. අප මෙහි පැමිණියේ අපගේ චරිත කොටස් රඟ දැක්වීමටයි. ස්වර්ණමය යුගයේ සිට කලි යුගයේ අවසානය දක්වා අපි අපගේ චරිත කොටස් රඟ පා ඇත. මෙය දැන් අළුත් නිර්මාණයක් වෙයි. ඔබ එවන් චරිත කොටස් රඟපෑවේ කෙසේද කියා පියා, නිර්මාණකරු ඔය දරුවන්ට විස්තර කර දී ඇත. ඔබ උපත් 84 හි චක්‍රය වටා ගිය බව, ඔබ පෙර දැන සිටියේ නැත. පියා දැන්, උපත් 84 හි චක්‍රය වටා ගොස් ඇති ඔය දරුවන්ට කතා කරයි. සෑම කෙනෙකුටම උපත් 84 ක් ගත නොහැක. උපත් 84 හි චක්‍රය භ්‍රමණය වන ආකාරය ඔබ විස්තර කළ යුතුයි. එය වසර සිය දහස් ගණනක කාරණයක් නොවෙයි. අපි සෑම වසර 5000 කට වරක්ම අපගේ චරිත කොටස් රඟපෑම සඳහා පැමිණෙන බව ඔය දරුවන් දනී. අප නළුවන්ය. උසස්ම-උසස් පියාට රඟපෑමට විශේෂ කොටසක් ඇත. බ්‍රහ්මාට සහ විෂ්ණුට රඟපෑමට විශේෂ කොටස් ඇතැයි ඔබ නොකියයි. දෙදෙනාම උපත් 84 හි චක්‍රය වටා යයි. ශංකර්ට මෙම ලෝකයේ රඟපෑමට චරිත කොටසක් නොමැත. ත්‍රිමූර්ති පිංතූරයේ, ස්ථාපනය, විනාශය සහ පැවැත්ම පෙන්වා ඇත. ඔබ පෙන්වන පිංතූර ඔබ විස්තර කළ යුතුයි. පැරණි ලොවෙහි විනාශය සිදුවිය යුත්තේ සංගම් යුගයේදීය. සිතිවිලි මාර්ගයෙන් දිරිගන්වන්නා යන වචන භාවිත කිරීම වැරදිය. ඇතැමෙක් අද මට එළියට යෑමට මගේ සිතිවිලි මට දිරිගන්වන්නේ නැත යැයි කියයි. සිතිවිලි මාර්ගයෙන් දිරි ගැන්වීම යනු සිතිවිලිය-එයට වෙනත් අරුතක් නොමැත. උත්තරීතර ජීවය සිතිවිලි මාර්ගයෙන් ක්‍රියා සිදු කරන්නේ නොමැති අතර දැනුම වුවද සිතිවිලි මාර්ගයෙන් ලබා ගත නොහැක. පියා චරිත කොටසක් රඟපෑමට පැමිණෙන්නේ මෙම භෞතික ඉන්ද්‍රියන් තුළිනි. ඔහු කරන්කරවන්හාර් ය. ඔහු ක්‍රියා කරන්නේ දරුවන් තුළිනි. ඔහුට ශරීරයක් නොමැතිව කිසි දෙයක් කළ නොහැක. කිසි කෙනෙක් මේ දේවල් නොදන්නා අතර කිසි කෙනෙක් පියා වන දෙවියන්ව දන්නේ ද නැත. ඍෂිවරු, මුනිවරු ද පැවසුවේ ඔවුන් දෙවියන්ව නොදන්නා බවය. ඔවුන්ට ජීවය පිළිබඳ හෝ උත්තරීතර ජීවය පිළිබඳ හෝ දැනුම නොමැත. පියා ප්‍රධානතම නිර්මාණකරු මෙන්ම අධ්‍යක්ෂකද වෙයි. ඔහු උපදෙස් ලබා දෙයි. ඔහු ඔබට ශ්‍රීමත් ලබා දෙයි. මිනිසුන්ගේ බුද්ධිය තුළ සර්ව ව්‍යාප්තිය පිළිබඳ දැනුම ඇත. බාබා අපගේ පියා බව ඔබට වැටහෙයි. ඔවුන් පවසන්නේ ඔහු සර්ව ව්‍යාප්තියි කියාය. එබැවින් ඔවුන්ට, ඔහු පියා බව වටහා ගත නොහැක. මෙය අසීමිත පියාගේ පවුල බව ඔබට වැටහෙයි. ඔහු සර්ව ව්‍යාප්තයි කියා කීමෙන් පවුලක සුගන්ධය ඇති නොවෙයි. ඔහුට කියන්නේ අශරීරික ශිව් බාබා, අශරීරික ජීවයන්ගේ පියා කියාය. ජීවයන්ට ශරීරයක් ඇති විටයි ඔවුන් බාබා යැයි කියන්නේ. ශරීරයක් නොමැති ජීවයකට කතා කළ නොහැක. ඔබ භක්ති මාර්ගයේදි දෙවියන්ට අඬ ගැසුවේ, එම බාබා දුකින් මුදවන්නා මෙන්ම, සතුට ප්‍රදානය කරන්නා ද යන අවබෝධය ඇතුවයි. ඔබ සතුටු දේශයේ සතුටත්, සාම දේශයේ සාමයත් ලබා ගනී. මෙහි ඇත්තේ දුක පමණයි. ඔබට මෙම දැනුම

ලැබෙන්නේ පැරණි ලොව සහ නව ලොව අතර ඇති සංගම් යුගයේදීය. පියා පැමිණෙන්නේ නව ලොව ස්ථාපනය සහ පැරණි ලොවෙහි විනාශය සිදුවීමට ඇති විට පමණයි. පළමුවෙන්ම ඔබ සැම විටම කතා කළ යුත්තේ නව ලොවෙහි ස්ථාපනය පිළිබඳවයි. පැරණි ලොවෙහි විනාශය පිළිබඳව පළමුවෙන් කතා කිරීම වැරදියි. ඔබ දැන් අසීමිත නාටකයේ දැනුම ලබමින් සිටියි. නළුවන්, චරිත කොටසක් රඟපෑම සඳහා තම නිවෙස් වලින් පැමිණෙන විට ඔවුන් සාමාන්‍ය ඇඳුමින් පැමිණෙයි. ඉන්පසු ඔවුන් තම ඇඳුමට මාරු වෙයි. ඉන්පසු නාටකය අවසන් වූ විට, ඔවුන් තම ඇඳුම ගලවා දමා ආපසු නිවෙසට යයි. එයට සමානව ඔය ජීවයන්ද ඔබලාගේ නිවහනින් මෙහි පැමිණෙන විට අශාරීරිකවයි පැමිණෙන්නේ. ඔබ මෙහි පැමිණ ඇඳුමක ස්වරූපය ඇති ශරීරයක් පැළඳ ගනී. සැම ජීවයකටම තමන්ගේම චරිත කොටසක් ලැබී ඇත. මෙය අසීමිත නාටකයකි. මේ මුළු අසීමිත ලොවම දැන් පැරණිය. ඉන්පසු අළුත් ලොව ඇති වෙයි. එම ජනගහණය ඉතා සුළු වන අතර ඇත්තේ එක් ධර්මයක් පමණයි. ඔය දරුවන් මෙම පැරණි ලොවින් ඉවත් වී එක් ධර්මයක් පමණක් ඇති සීමිත නව ලොවට යැමට සිටියි. ලොවෙහි අනේක විද ආගම් සහ අනේක විද මනුෂ්‍යයින් සිටින විට එය අසීමිත වෙයි. එහි එක් ධර්මයක් පමණක් සහ සුළු මනුෂ්‍ය සංඛ්‍යාවක් සිටියි. එක් ධර්මය ස්ථාපනය කිරීම පිණිස පියා පැමිණිය යුතුයි. ඔය දරුවන්ට අසීමිත නාටකයේ රහස් වැටහෙයි චක්‍රය භ්‍රමණය වන ආකාරය. මේ කාලයේ ප්‍රායෝගිකව සිදුවන සැම දෙයක්ම පසුව භක්ති මාර්ගයේදී උත්සවයක ආකාරයට සැමරෙයි. ඔය දරුවන් අංක පිළිවෙලට ඇති උත්සව පිළිබඳව දනී. උසස්ම-උසස්, දෙවියන්, ශිව් බාබා ගේ උපන් දිනය යැයි කියැවෙයි. අනෙක් උත්සවයන් ඇති කළ හැක්කේ ඔහු පැමිණියාට පසුවයි. පළමුවෙන්ම ශිව් බාබා පැමිණ ගීතාව කතා කරයි, එනම්, ඔහු මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම ඔබට කියයි. ඔබට මෙය ඉගැන්වීමත් සමඟම, ඔහු ඔබට යෝගාවද උගන්වයි. ඉතිං පළමුවෙන්ම පියා පැමිණි විට, ශිවාගේ උපන් දිනය තිබුණ. ඉන් අනතුරුව ගීතාවේ උපත සිදුවිය. ඔහු ජීවාත්මයන්ට දැනුම කතා කළේය, එබැවින් එය ගීතාවේ උපතයි. ඔය දරුවන් මේ සැම දෙයක් ගැනම සිතා, උත්සවයන් අංක පිළිවෙලට ලිවිය යුතුයි. ඔබගේ ආගමට අයත් වන අයට පමණයි මේ දේවල් වැටහෙන්නේ. සැම කෙනෙක්ම තමන්ගේ ආගමට ආදරය කරයි. අනෙක් ආගම් වල අය පිළිබඳ ගැටළුවක් නැත. කෙනෙක් වෙනත් ආගමකට ආදරය කළත් ඔහුට එම ආගමට යා නොහැක. අන් ආගම් වල අයට දිව්‍ය ලෝකයට යා නොහැක. එය වෘක්ෂයේ පිංතූරයෙන් ඉතා පැහැදිලියි. සැම ආගමක්ම හරියටම, පෙර පැමිණි කාලයේදීම නැවතත් පැමිණෙයි. පළමුවෙන්ම පියා පැමිණෙයි. ඔහු පැමිණ ඔබට රාජයෝගා උගන්වයි. එබැවින් මෙසේ කියැවේ ශිවා ගේ උපත ඇත, ඉන්පසුව ගීතාවේ උපතත්, ඉන් අනතුරුව, නාරායන් බවට පත්වන ක්‍රිෂ්ණාගේ උපතත් සිදුවෙයි. එවිට එය ස්වර්ණමය යුගයයි. ඔබ මෙය අංක පිළිවෙලට ලිවිය යුතුයි. මේවා දැනුම පිළිබඳ වූ කාරණාවන්ය. ශිවාගේ උපත සිදු වන්නේ කවදාද කියා මිනිසුන් හට වැටහෙන්නේ නැත. ඔහු ලබාදෙන දැනුමට ගීතාව කියා කියන අතර, එය ඉන්පසු අතුරුදහන් වෙයි. ජගදම්බා ආදීන්ගේ උපන්දිනය නිවාඩු දිනයක් නොවේ. මිනිසුන් මේ එක් දෙයක වත් දිනය, කාලය ආදිය දන්නේ නැත. ඔවුන් ලක්ෂ්මි සහ නාරායන්ගේ හෝ රාමා සහ සීතාගේ රාජධානීන් පිළිබඳව හෝ දන්නේ නැත. ඔවුන් දන්නේ අවසාන වසර 2500 දී පැමිණුනු අය පිළිබඳව පමණයි. කෙසේවෙතත්, ඊට පෙර විෂ්ණු ආදී සනාතන දෙව් දේවතා ධර්මයට අයත් දෙව් දේවතාවන්, විසුවේ කෙතරම් කලකට පෙරද කියා ඔවුන් නොදනී. චක්‍රය වසර 5000 කට වඩා පැවතිය නොහැක. චක්‍රයේ පළමුවන භාගයේදී එය ඔවුන්ගේ රාජධානියයි. චක්‍රයේ දෙවන භාගයේදී ජනගහණය අධික ලෙස වැඩි වෙයි. ඉතිං චක්‍රය, මීට වඩා වැඩි වසර ගණනක් වන්නේ කෙසේද ? උපත් මිලියන 8.4 ක් තිබිය නොහැක. ඒ මිනිසුන් විශ්වාස කරන්නේ කලියුගයේ කාලය වසර සිය දහස් ගණනක් බවයි. ඔවුන් මිනිසුන්ව පූර්ණ අන්ධකාරයේ දමා ඇත. මුළු චක්‍රයේම කාලය වසර 5000 ක් වීම සහ ඔවුන් පවසන අන්දමට කලි යුගයේ තව වසර 40,000 ක කාලයක් ඉතිරි වී තිබීම අතර විශාල වෙනසක් තිබේ. යුද්ධයක් ඇතිවන විට දෙවියන් පැමිණිය යුතු බව ඔවුන්ට හැඟේ. කෙසේවෙතත්, දෙවියන් පැමිණිය යුත්තේ සංගම් යුගයේදීය. පියා පවසන්නේ සැම චක්‍රයකදීම සංගම් යුගයේදී මම එන්නෙමි. පියා පැමිණෙන්නේ නව ලොව ස්ථාපනය කිරීමට සහ පැරණි ලොව විනාශ කිරීමටයි. නව ලොවෙහි ස්ථාපනය සිදුවන විට, ඉන්පසු පැරණි ලොව අනිවාර්යයෙන්ම විනාශ වෙයි, එම යුද්ධය ඇති වන්නේ මේ සඳහාය. මෙහිදී ශංකර්ගේ සිතිවිලි මාර්ගයෙන් දිරිගැන්වීමක් ආදිය පිළිබඳ ගැටළුවක් නොමැත. මුළු ලොවම විනාශ වන බව වැටහෙයි. නව ලොවක් අවශ්‍ය බැවින්, භූමිකම්පා වලින් ගොඩනැගිලි ආදී සියල්ලක්ම විනාශ වෙයි. අළුත් ලොවක් අනිවාර්යයෙන්ම තිබිණි. දිල්ලිය, සුරඟනාවන්ගේ දේශය, පරිස්ථාන් විය. එය යමුනා ගං තෙර අසබඩ, ලක්ෂ්මි සහ නාරායන්ගේ රාජධානියේ විය. මෙහි පිංතූර තිබේ. ලක්ෂ්මි සහ නාරායන් දෙව්ලොවට අයත් බව කියැවේ. ඔවුන්ගේ මංගල උත්සවය සිදුවන ආකාරය පිළිබඳ දර්ශන ඔය දරුවන්ට ලැබී තිබේ. බාබා මේ සැම කරුණක්ම ඔබත් සමඟ පුනරීක්ෂණය කරයි. අච්චා, ඔබට කරුණු අමතක නම් බාබාව පමණක් සිහිපත්

කරන්න. ඔබට පියාව අමතක වෙයි නම්, ගුරුවරයාව සිහිපත් කරන්න. ඔබට අනිවාර්යෙන්ම ගුරුවරයා උගන්වන දේ මතක් වෙයි, එසේ නොවේද? ගුරුවරයා සිහිපත් කිරීමෙන් ඔබට දැනුම ද සිහිපත් වෙයි. ඔබගේ බුද්ධිය තුළ ඔබගේ අරමුණද ඇත. ඔබ මෙය සිහිපත් කළ යුතුයි මන්ද, මෙය ඔබගේ ශිෂ්‍ය ජීවිතය නොවේද? ඔබට උගන්වන කෙනා ඔබගේ පියාද වන බව ඔබ දන්නවා. භෞතික පියෙක් අතුරුදහන් වන්නේ නැත. ලෞකික සහ පාරලෞකික පියවරු සිටින අතර මෙම අලෞකික පියාද සිටියි. කිසි කෙනෙක් මොහුව සිහිපත් කරන්නේ නැත. ඔබගේ භෞතික පියාගෙන් ඔබට උරුමයක් ලැබෙයි. ඔබ අවසානය දක්වා ඔහුව සිහිපත් කරයි. ඔබගේ ශරීරය අත්හළ විට, ඔබ ගොස් තවත් පියෙක් ඇති කරයි. ඔබ උපතින් උපතට භෞතික පියෙකු ලබයි. මිනිසුන් දුකෙහි සහ සැපේදී පාරලෞකික පියාව සිහිපත් කරයි. ඔවුන්ට දරුවෙක් ලැබෙන විට එම දරුවා දෙවියන් ලබා දුන් බව ඔවුන් පවසයි. ඔවුන් ප්‍රජාපිතා බ්‍රහ්මාව සිහිපත් කරන්නේ කුමකටද? ඔහුගෙන් ඔබට කිසි දෙයක් ලැබෙන්නේ නැත. ඔහුට කියන්නේ අලෞකික පියා කියාය. ඔබ දන්නවා ඔබට ඔබගේ උරුමය ලැබෙන්නේ බ්‍රහ්මාගේ මාර්ගයෙන් ශිව් බාබාගෙන් බව. ඔබ ඉගෙනගන්නා ලෙසින්ම, මොහුද ඉගෙන ගනී. මෙම රථය උපකරණය වී ඇත. උපත් රාශියක අවසානයේදී මෙම ශරීරය රථය වී ඇත. රථයට නමක් දිය යුතුයි. මෙම අත්හැරීම අසීමිතයි. රථය සෑම විටම සිටියි, එහෙත් වෙනින් කිසිවෙකුට වගකිව නොහැක. ගමන් කරන අතර තුරදී, ඔවුන් පියා අතහැර පලා යන අය බවට පත්වෙයි. නාටකයට අනුව මෙම රථය පත් කොට ඇත. ඔහුට කියන්නේ වාසනාවන්ත රථය කියාය. ඔබ කිසිවෙකුට වාසනාවන්ත රථ යැයි කියන්නේ නැත. ඔබට දැනුම දීම සඳහා පියා ඇතුළු වන එක් කෙනා පමණයි වාසනාවන්ත රථය ලෙසට සැලකෙන්නේ. ස්ථාපනයේ කාර්යය සිදු කිරීමට ඔහු උපකාරී වෙයි. ඔබලා වාසනාවන්ත රථ නොවේ. මෙම ජීවාත්මය මෙම රථය තුළ අසුන්ගෙන ඉගෙන ගනිමින් සිටියි. මෙම ශරීරයේ අසුන්ගෙන සිටින අතරේ ජීවාත්මය පාරිශුද්ධත්වයට පත්වෙයි. එබැවින් ඔහු අසුන්ගෙන අපට උගන්වන මෙම ශරීරයේයි, ශ්‍රේෂ්ඨත්වය ඇත්තේ. මෙම අවසන් උපත ඉතාමත් වටිනා එකකි. ඉන්පසු ඔබගේ ශරීර මාරු කොට ඔබ දේවතාවන් වෙයි. ඔබ ඉගෙනුම් ලබන්නේ මෙම පැරණි ශරීරය තුළිනි. ඔබ අයත් වන්නේ ශිව් බාබාටයි. ඔබගේ පෙර ජන්මය, පැන්සයක් තරම්වත් නොවටිනා එකක් විය. දැන් ඔබගේ ජීවිතය පවුමක් තරම් වටිනා එකක් බවට පත් වෙමින් තිබෙයි. ඔබ ඉගෙන ගන්නා තරමට අනුව උසස් තත්ත්වයක් ලබයි. ප්‍රධානතම දෙය මෙනෙහි කිරීමේ වන්දනා ගමන බව පියා විස්තර කර තිබේ. ඔබ අපවිත්‍රභාවයෙන් පාරිශුද්ධත්වයට පත්වන, භාරතයේ පෞරාණික යෝගාව යැයි මෙයට කියයි. ඔබ සෑම කෙනෙක්ම දෙව්ලොව වැසියන් බවට පත්වෙයි. කෙසේවෙතත්, එය බලපැවැත්වෙන්නේ ඔබ ඉගෙනගන්නා තරම මතයි. ඔබ මෙම අසීමිත පාසැලේ අසුන්ගෙන සිටියි. ඉන්පසු ඔබ දේවතාවන් බවට පත්වෙයි. උසස් තත්ත්වයක් හිමි කරගන්නේ කවුරුන්ද, සහ ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් මොනවාද කියා ඔබට වටහා ගත හැක. පෙරකළ අපටද කිසිම සුදුසුකමක් තිබුණේ නැත. අප රාක්ෂකයාගේ උපදෙස් පිළිපදිමින් සිටියේය. අප දැන් දෙවියන්ගේ උපදෙස් ලබමින් සිටියි. රාක්ෂකයාගේ උපදෙස් පිළිපැදීමෙන් අප පහතට වැටෙයි. දෙවියන්ගේ උපදෙස් පිළිපැදීමෙන් අප ඉහළට නඟී. දෙවියන්ගේ උපදෙස් අපට ලබා දෙන්නේ එක් අයෙක් පමණක් වන අතර, බොහෝ දෙනෙක් අපට රාක්ෂක උපදෙස් දෙයි. ඔබට බොහෝ දෙනෙක්ගෙන් උපදෙස් ලැබෙයි- මව, පියා, සහෝදරයන්, සහෝදරියන්, ගුරුවරුන්, ගුරුන් ආදීන්ගෙන්. ඔබට දැන් එක් අයගේ උපදෙස් පමණක් ලැබෙයි. මේවා ඔබට උපත් 21 කට ප්‍රයෝජනවත් වෙයි. එබැවින් ඔබ එවන් උපදෙස් පිළිපැදිය යුතු නොවේද? ඔබ කොතෙක් දුරට උපදෙස් පිළිපදිනවාද, ඒ අනුව ඉහළ තත්ත්වයක් ලබයි. ඔබ අඩුවෙන් උපදෙස් පිළිපැද්දොත් ඔබ ලබන තත්ත්වයද පහත් වෙයි. ශ්‍රීමත් පැමිණෙන්නේ දෙවියන්ගෙනි. දෙවියන් උසස්ම උසස් කෙනාය, ක්‍රිෂ්ණාව සෑමටම වඩා උසස් කරවන්නේ ඔහුයි. ඉන්පසු රාවණ් ඔහුව පහත්ම කෙනා බවට පත් කළේය. පියා ඔබව ලස්සන කරවන අතර රාවණ් ඔබව අවලස්සන කරවයි. පියා ඔබට ඔබගේ උරුමය ලබා දෙයි. ඔහු දුර්ගුණ වලින් තොරය. දේවතාවන්ගේ ගුණ ගයන්නේ 'සෑම ගුණයකින්ම පිරුණු, ගුණවත්කමින් පරිපූර්ණ...'යනුවෙනි. සන්‍යාසීන්ට 'සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර වූ' යැයි නොකියයි. ස්වර්ණමය යුගයේදී, ජීවාත්ම සහ ශරීර යන දෙකම පාරිශුද්ධ ය. සෑම කෙනෙක්ම දේවතාවරුන්ව දනී. ඔවුන් සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර බැවින් ඔවුන් පරිපූර්ණ ලොවෙහි අධිපතියන් වෙයි. ඔවුන් දැන් එය නොවෙයි. ඔබ පසුව එසේ වෙයි. පියා පැමිණෙන්නේ සංගම් යුගයේදී පමණයි. බ්‍රාහ්මණවරුන් නිර්මාණය වන්නේ බ්‍රහ්මාගේ මාර්ගයෙනි. ඔබ සෑම කෙනෙක්ම බ්‍රහ්මාගේ දරුවන්ය. ඔහු මීමුත්තායි. ඔවුන්ගෙන් අසන්න ඔබ ප්‍රජාපිතා බ්‍රහ්මා යන නම අසා නැද්ද? උත්තරීතර පියා, උත්තරීතර ජීවය ලෝකය නිර්මාණය කරන්නේ බ්‍රහ්මාගේ මාර්ගයෙන් නොවේද? බ්‍රාහ්මණ වංශය ඇත. ඔබ එවිට සහෝදර, සහෝදරියන්, බ්‍රහ්මාගේ මුවින් උපන් නිර්මාණය බවට පත්වෙයි. රජවරුන් හෝ රාජිණියන්

පිළිබඳ ප්‍රශ්නයක් මෙහිදී නොමැත. බ්‍රහ්මීණ් වංශය පවතින්නේ මෙම කෙටි සංගම් යුග කාලය තුළදී පමණයි. පාණ්ඩවයන්ට වත් කෞරවයන්ටවත් රාජධානියක් නොමැත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. උපත් 21 කට උසස් තත්ත්වයකට සෑම හිමිකමක්ම ලබා ගැනීමට, රාක්ෂකයාගේ සෑම උපදෙසක්ම පිළිපැදීම අත්හැර, දෙවියන්ගේ උපදෙස් පමණක් පිළිපදින්න. සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර වන්න.
2. ඔබගේ පැරණි ශරීරයේ අසුන්ගෙන සිටිනා අතරම, පියාගේ ඉගැන්වීම් ධාරණය කොට දේවතාවක් වන්න. මෙය ඉතාමත් වටිනා ජීවිතයකි. ඔබ මෙම ජීවිතයේදී පවුමක් තරම් වටිනා කෙනෙකු විය යුතුයි.

**වරදානය:** ඔබ සියලු සබැඳියාවන්හි සහයෝගය අත්විඳීමෙන්, නිරන්තර සහ පහසු යෝගීවරයෙක් වේවා.

උපකාර ගැනීම, එනම් සෑම මොහොතකම සියලුම විවිධ සම්බන්ධතා, පරම පියා සමඟ අත්විඳීම යනු, පහසු යෝගාවේ සිටීමයි. ඕනෑම වෙලාවක සබැඳියාවක වගකීම ඉටුකිරීමට පරම පියා බැඳී සිටිනවා. මුළු කල්පයෙන්ම, ඔබට සියලු අත්දැකීම්වල ආකාරය තිබෙන්නේ දැන් පමණයි. එබැවින්, සෑම විටම සියලු සබැඳියාවන්හි උපකාරය ලබාගෙන, නිරන්තර සහ පහසු යෝගීවරයෙක් වන්න, මන්ද, සියලු සබැඳියාවන්හි අත්දැකීමේ සහ ලැබීම්වල ගිලී සිටින අයට, පහසුවෙන් පැරණි ලෝකයේ වාතාවරණය ඉක්මවා සිටීමට හැකිය.

**පාඨය:** බ්‍රහ්මණ ස්වරූපයේ විශේෂතාවය වන්නේ, සියලු බලයන්ගෙන් පිරී සිටීමයි.

***** ඕම් ශාන්ති *****